
**සුජීවා ප්‍රනාන්දු**
සහකාර අධ්‍යක්ෂ
පරිසර දූෂණ පාලන සහ රසායනික ද්‍රව්‍ය කළමනාකරණ අංශය,පරිසර අමාත්‍යාංශය

# කොවිඩ් (Covid - 19) වසංගතයට මඟපෑදූ පරිසර විනාශය






පසුගිය දශක ගණනාව සැලකිල්ලට ගත්විට මෙතෙක් වාර්තා වී ඇති බිහිසුණුතම වසංගතයට අද ලෝකය මුහුණ දෙමින් සිටී. මෙවැනි වසංගතයන් ඇතිවිය හැකි බවට පුරෝකතනයන් කර තිබුණු නමුත් ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු නොවීම වසංගතය උග්‍ර තත්ත්වයට පත්වීමට හේතුවිය.

2019 වසර අග භාගයේදී චීනයේ වුහාන් නගරය ආශ්‍රිතව මුලින්ම වාර්තා වූ කොවිඩ්-19 රෝගය අද වන විට මුළු ලොවම බිලිගෙන ඇත. මේවන විට ලොව පුරා රෝගීන් මිලියන 247 ක් පමණත්, මරණ මිලියන 4.9 පමණත්, වාර්තාවී ඇත. සමහර රටවල් අද වනවිට කොරෝනා තුන්වන රැල්ලටද මුහුණ දෙමින් සිටින අතර මෙම රෝගය උතුරු ආක්ටික් ප්‍රදේශය දක්වා පැතිරී තිබේ.

අද වනවිට ලොව පුරා කොවිඩ් රෝගයේ පැතිරීම ලෝක සෞඛ්‍ය සංවිධාන වෙබ් අඩවියේ පහත අයුරින් දැක්වේ.




ගෝලීයව 2021 නොවැම්බර් 01 දින යුරෝපීය වේලාවෙන් (CET) ප.ව. 5.04 වනවිට තහවුරු කළ කොවිඩ් 19 රෝගීන් 246,594,191 සංඛ්‍යාවක් හා 4,998,784 ක මරණ සංඛ්‍යාවක් ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත වාර්තා වී ඇති අතර 2021 ඔක්තොම්බර් 31 වනවිට සමස්ත එන්නත්කරණයට ලක් වූ ජනග්‍රහනය 6,893,866,617 ලෙස වාර්තා වේ.

ඉහත ලෝක සිතියමේ සූචියට අනුව, තද නිල් පැහැයෙන් රෝගීන් මිලියනයකට වඩා වැඩි ප්‍රදේශත් ලා නිල් පැහැයෙන් රෝගීන් 1- 5000 ඇති ප්‍රදේශත් දැක්වේ.

කොවිඩ් -19 රෝගය ඇතිවීම පිළිබඳ විද්‍යාත්මක අනාවරණයන් මෙතෙක් නිශ්චිතවම ප්‍රකාශයට පත්කර නොමැති අතර, මෙවැනි වසංගත ඇති වියහැකි ආකාර කීපයක් පවතී. මේ පිළිබඳව ඇති මතයන් වන්නේ වන ජීවීන්ගෙන් වෛරසය මනුෂ්‍යයාට බෝවීම හෝ විද්‍යාගාරයක විකිරණය කරන ලද වෛයිරස පරිසරයට නිදහස් වීම හෝ මුදා හැරීමයි.

නමුත් මින් පෙර ඇතිවූ වසංගතයන් සලකා බැලීමේදී සතුන් මගින් මිනිසුන්ට බෝවන රෝගවල (zoonotic diseases) වැඩිවීමක් දක්නට ඇත. ඉදිරියේදී මෙය 75% පමණ වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙයට පෙර ඇතිවී තිබෙන වසංගත තත්ත්වයන් කීපයක් සැලකුවිට, උදාහරණ ලෙස ඌරන්ගෙන් ඇතිවූ සූකර උණ, පක්ෂීන්ගෙන් ඇතිවූ කුරුළු උණ, ගවයන්ගෙන් ඇතිවූ උමතු ගව රෝගය (Mad Cow Disease) මෙන්ම, ඔටුවන්ගෙන් මැදපෙරදිග ඇතිවූ ස්වසන රෝගය (Middle East Respiratory Syndrome -MERS) ද, වවුලන් හෝ ප්‍රයිමේටාවන්ගෙන් බෝවුනු ඉබොලා රෝගය ද (Ebola) හැඳින්විය හැක.



සූකර උණ හේතුවෙන් මියගිය ඌරන්



කුරුළු උණ හේතුවෙන් මියගිය කුකුළන්

මෙලෙස ඇතිවූ වසංගත තත්ත්වයන් නිසා විශාල ලෙස සතුන්ගේ සහ මිනිසුන්ගේ ජීවිත හානිවූ අතර ආර්ථික අලාභ සිදුවී ඇත,

| **රෝගය** | **බෝවන සත්ත්වයන්** | **වසංගත ඇතිවූ වර්ෂ** | **සිදු වී ඇති බලපෑම්/ රෝගීන්/ මරණ සහ මුල්‍යමය අලාභ** |
|---|---|---|---|
| කුරුළු උණ<br>Avian Influenza | පක්ෂීන්/<br>කුකුළන් | 2004<br>2015 | නැගෙනහිර ආසියාවේ ඇතිවූ වසංගත තත්ත්වය - ඇමෙරිකානු ඩොලර් බිලියන් 20 අලාභ සිදුවිය.<br><br>ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇතිවූ වසංගත තත්ත්වයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.3 අලාභයක් සිදුවූ අතර කුකුළන් මිලියන් 48 ජීවිතක්ෂයට පත්විය. |

| රෝගය | බෝවන සත්ත්වයන් | වසංගත ඇතිවූ වර්ෂ | සිදු වී ඇති බලපෑම්/ රෝගීන්/ මරණ සහ මූල්‍යමය අලාභ |
|---|---|---|---|
| සාර්ස් SARS | වවුලන් | 2002 | රෝගීන් 8000 සහ මරණ 800 වාර්තා විය. අලාභය අමෙරිකානු ඩොලර් බිලියන් 41.5 |
| මර්ස් MERS | ඔටුවන් | 2012 | රටවල් 27න් රෝගීන් වාර්තා වූ අතර එය 624ක් සහ මරණ 49 කි. |
| ඉබෝලා Ebola | වවුලන් හෝ ප්‍රයිමේටාවන් | 2014 - 2015 | ගිනියා, ලයිබීරියා, සියරාලියොන් යන රටවල - රෝගීන් 28,616 වාර් තා වූ අතර 11,310ක් මරණයට පත්විය. |

පසුගිය දශක කීපය තුළ ඇතිවූ වසංගත තත්ත්වයන්වලට හේතු වුයේ අධික ලෙස නාගරීකරණය වීමත්, එම නගර තුළ අවශ්‍ය සනීපාරක්ෂක ක්‍රමවේද පවත්වා ගැනීමේ අසීරු බවත් නිසා ලෙඩ රෝග සීඝ්‍රයෙන් පැතිරීමයි. එමෙන්ම නිවාස, වගාබිම් ආදිය සඳහා කැලෑ එළි කිරීම නිසා වන සතුන් ආහාර සොයා මිනිස් වාසස්ථාන ආශ්‍රයට පැමිණීම නිසා සතුන්ගෙන් වෛරස් ඇතුළු රෝගකාරකයින් මිනිසුන්ට බෝවීමත්, වන සතුන් නීති විරෝධී ලෙස ඝාතනය කර ආහාරයට ගැනීමත් වසංගත ඇතිවීමට හේතු ලෙස දැක්විය හැකිය .


වෛරස්, පෘථිවියේ ආරම්භයේ සිටම පැවතිය අතර ලොව පුරා සිටින වන සතුන්ගේ වෛරස් විශාල ප්‍රමාණයක් පවතී. මිනිසුන් විසින් පරිසර පද්ධති ආක්‍රමණය කිරීමෙන් සතුන්ට හිමි වූ ඉඩ කඩ අඩුවී ඔවුන් පීඩනයකට පත් වේ. සතුන් අතර බෝවන රෝග පැතිරීමට මෙය හේතුවේ. මෙවැනි පීඩනය පත්වූ තත්ත්ව යටතේ වෛරස් ඇතුළු රෝගකාරකයින් අලුත් ග්‍රාහකයන් සොයා යෑමක් සිදුවේ. ගෝලීයකරණය හමුවේ ලෝකය වෙනදාට වඩා සම්බන්ධතා සහ පහසුකම් වැඩි දියුණු වීමත් සමග සංචරණය වැඩිවීමෙන් මෙම රෝග සීඝ්‍රයෙන් ලොවපුරා පැතිරීම සිදුවේ.

මිනිසා වනාන්තර තුළ ජීවත්වූ සමයේ ඔවුන් පරිසරය සමග බොහොම සහජීවනයෙන් ජීවත් වූ අතර පසුව මිනිසා පරිසරය තම පාලනයට නතු කරගැනීමට යත්න දැරීමත් සමග පරිසර විනාශය ආරම්භවිය. පරිසරය සීඝ්‍රයෙන් විනාශවීමත් සමගම පරිසර සමතුළිතතාවය බිඳීයාම වසංගත ඇතිවීමට තෝතැන්නක් සපයයි. උදාහරණ ලෙස සමතුළිත පරිසර පද්ධති විනාශ කර විශාල වගාභූමි ඇති කිරීමත්, එම භූමිවල එක වර්ගයක බෝග වගා කිරීමත් විශාල ලෙස පලිබෝධකයින් ඇතිවීමට සහ රෝග සීඝ්‍රයෙන් පැතිරීමට උපකාරී වේ.

අද වනවිට පෘතුවියට දැරිය නොහැකි තරමට පරිසරය දුෂණය වී ඇති අතර පරිසර විනාශය හේතු කොටගෙන පරිසර පද්ධතීන් අසමතුලිත වී දේශගුණ විපර්යාස, කාන්තාරකරණය, ඕසෝන වියන විනාශ වීම, ජෛව විවිධත්වය තර්ජනයට ලක්වීම, සාගරයන් තුළ ඔක්සිජන් රහිත මළ කලාප ඇතිවීම ආදිය දැකිය හැකිය.

සතුන්ගෙන් ඇතිවන රෝග ව්‍යාප්තිය සැලකූවිට ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය පවසන අන්දමට ඉදිරියේදී විශාල සත්ත්ව ගොවිපොළවල් පවත්වා ගෙන යාම අනතුරුදායක විය හැකි බව පෙනේ. එබැවින් ඉදිරියේදී කුඩා ගොවිපොළවල් ඇති කිරීම වඩා යෝග්‍ය බව යෝජනාවී ඇත.


රෝගීන් නොයෙකුත් රෝග සඳහා ලබා ගන්න ප්‍රතිජීවක වෛද්‍ය උපදෙස් නොමැතිව හිතුමතයට භාවිතා කිරීමත්, නිසි මාත්‍රාවෙන් භාවිතා නොකිරීමත්, අනිසි ලෙස පරිසරයට බැහැර කිරීමත් නිසා අද වන විට ප්‍රතිජීවික ප්‍රතිරෝධිතාවයක් ගොඩ නැගී ඇති අතර මේ නිසා අනාගතයේදී මෙම ප්‍රතිජීවක භාවිත කිරීමෙන් රෝග සුව කිරීමට නොහැකි වන අතර ඒ සඳහා වෙනත් නව ප්‍රතිජීවක අවශ්‍ය වනු ඇත. මෙසේ වනුයේ රෝගකාරක මෙම ඖෂධවලට ප්‍රතිචාර නොදැක්වීමයි. සතුන්ගෙන් බෝවන රෝග සඳහා ද මෙය අදාළ වේ. මෙයට හේතුව රෝගකාරක විකරණය වීමයි.





(UNEP FRONTIERS - 2016 REPORT)

ඉහත සිතියමේ ඖෂධවලට ප්‍රතිරෝධී රෝග ඇතිවූ ස්ථාන තද නිල් පාටින් සඳහන් කර ඇත.

## වසංගත තත්ත්ව ඇතිවීමට බලපෑ හේතු






දැනට පවතින වසංගත තත්ත්වයන් අනුව, සෞඛ්‍ය අංශ මගින් මානව සෞඛ්‍ය ගැන පමණක් අවධානය යොමු කිරීමෙන් මෙම වසංගත තත්තව මැඩලිය නොහැකි බව මේ වනවිට වටහා ගෙන ඇති අතර අදාල අංශ සම්බන්ධ කර ගනිමින් සතුන්ගේ සෞඛ්‍ය, ශාක සහ පරිසර පද්ධතියේ සෞඛ්‍ය එක්ව සැලකීම (One Health) වැදගත් බවත්, මෙමගින් මානව සෞඛ්‍ය වඩාත් හොඳින් ආරක්ෂා කරගත හැකි බව වටහාගෙන ඇත. මෙහිදී අදාල ක්ෂේත්‍ර එක්ව ප්‍රතිපත්ති, වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, පර්යේෂණ සඳහාද අදාල විවිධවූ ක්ෂේත්‍ර සහසම්බන්ධ කරගනී. මෙමගින් මහජන සෞඛ්‍ය හොඳින් පවත්වාගෙන යාමට හැකිවනු ඇත.





පාරිසරික සෞඛ්‍ය, සත්වයන්ගේ සෞඛ්‍ය, සහ මානව සෞඛ්‍ය හොඳින් පවත්වාගෙන යාමට

කටයුතු කිරීමෙන් සෞඛ්‍ය සම්පන්න පරිසරයක්, සෞඛ්‍ය සම්පන්න සත්ත්වයන්, සහ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ඇතිකළ හැක.



පහත දැක්වෙන සිතියමේ, ලොව පුරා සතුන්ගෙන් බෝවන රෝග ඇතිවූ අවස්ථා දක්වා ඇති අතර, රතු පැහැයෙන් දක්වා ඇත්තේ වන ජීවීන්ගෙන් රෝග බෝවූ අවස්ථාය.




(UNEP FRONTIERS - 2016 REPORT)

එබැවින් ඉදිරියේදී ඇතිවන සතුන්ගෙන් බෝවන වසංගත රෝග අවම කිරීම සඳහා පරිසර පද්ධති සංරක්ෂණය, ඉතා වැදගත් වේ. ඒ සඳහා ජෛව විවිධත්වය සුරැකීම, දේශගුණ විපර්යාස මැඩලීම, පරිසර දූෂණය අවම කිරීමට කටයුතු කළ යුතු වේ. එමගින් පාරිසරික සෞඛ්‍ය මෙන්ම සත්ත්වයන්ගේ සෞඛ්‍යයද සුරැකේ. මානව සෞඛ්‍ය සුරැකීම සඳහා එය ඉතා අත්‍යවශ්‍ය වේ.

පරිසර සංරක්ෂණය සදහා ස්වභාවික සම්පත් නාස්තිය වලක්වා කාර්යක්ෂමව යොදා ගැනීමත්, රසායනික ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය නිසිලෙස කළමනාකරණය කිරීමත්, පරිසර හිතකාමී බලශක්තිය භාවිතය, හරිත රැකියා ප්‍රවර්ධනය, සෑම විටම පාරිසරික සහ කාබනික පියසටහන අවම කිරීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා සම්පත් විනාශවන රේඛීය ආර්ථිකයෙන් මිදී චක්‍රීය ආර්ථිකයකට යොමු වීමත් වැදගත් වේ.

පරිසරය සුරැකීමෙන්. වසංගතවලින් මිදී මානව සෞඛ්‍ය ආරක්ෂා කරගනිමු.